**මන්මුනෙයි පාලම ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය- 2013**

------------------------------------------------------------

මන්මුනෙයි පාලම ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (ජ.ජා.ස.ආ.)සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) අතර 2011 සැප්තැම්බර් 13 දින එළඹි අංක 1160700 දරන ප්‍රදාන ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සම්පාදනය සහ කාලපරිච්ඡේදය

--------------------------------------------------------------------------------------------

මන්මුනෙයි පාලම ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ආධාර ගිවිසුමට අනුව, මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ මන්මුණේ පිහිටි කලපුවේ බටහිර හා නැගෙනහිර එක්කරමින් පාලමක් ඉදිකිරීම වේ. ආධාර ගිවිසුමට අනුව, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපාන යෙන් මිලියන 1,206 ක් වේ. ව්‍යාපෘතියෙහි කටයුතු 2012 ජුනි 29 දින ආරම්භ කළ අතර 2014 මැයි 15 වන විට අවසන් වීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය පුකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයිමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම් වගකීම් සහ ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘතිය කළමනාකරණයෙහිලා සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ආධාර දෙනු ලබන නියෝජිත ආයතනයෙන් ලැබුණු අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් වූ වියදම්, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියෙහි ප්‍රගතිය, ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වීම පිණිස අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගනු ලැබුවේද යන බව,

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ නියමකර ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියෙහි අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඌ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති ප්‍රදාන සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**----------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, හා

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 4.1 මූල්‍ය කාර්යසාධනය

----------------------

මූල්‍ය ප්‍රකාශනවලට හා විගණනයට ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ වියදම රු. 801,866,055 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,199,098,742 ක් විය. සමාලෝචිත වර්ෂයේ සහ 2012 වර්ෂයේ ව්‍යාපෘතියෙහි වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| ජංගම නොවන වත්කම් | 29,868 | - | 29,868 |
| ඉදිකිරීම් පිරිවැය | 699,843,856 | 335,653,321 | 1,035,497,177 |
| උපදේශන ගාස්තු | 85,456,642 | 61,402,392 | 146,859,034 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම් | 16,535,689 | 176,974 | 16,712,663 |
| එකතුව | 801,866,055 | 397,232,687 | 1,199,098,742 |

## 5. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

--------------------

### 5.1 අරමුදල් උපයෝජනය

-------------------------

අරමුදල් මූලාශ්‍රය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන සහ සමාලෝචන වර්ෂය තුළදී අරමුදල් උපයෝජනයට අදාල ඇතැම් වැදගත් සංඛ්‍යා ලේඛන සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල්වල සමුචිත වියදම පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | වාර්ෂික අයවැය මඟින් වෙන්කළ ප්‍රතිපාදනය | සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | ජපාන යෙන් (මි.) | රු. (මි) | රු. (මි.) | ජපාන යෙන් (මි.) | රු. (මි) | ජපාන යෙන් (මි.) | රු. (මි.) |
| ප්‍රදානය | 1,206 | 1,865 | 850,982 | 357,704 | 463,291 | 596,784 | 850,982 |
| ශ්‍රී.ලං.ර. | - | 397 | 25,606 | - | 25,606 | - | 25,606 |
| | 1,206 | 2,262 | 876,588 | 357,704 | 488,897 | 596,784 | *876,588 |

*අත්තිකාරම් සහ උපචිත වියදම් ඉවත් කිරීම නිසා මෙම මුදල 4.1 ඡේදයේ දක්වා ඇති මුදලින් වෙනස් වේ.

**5.2 භෞතික කාර්යසාධනය**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාලම මත වීථි ආලෝකකරණ කිරීම අත්‍යවශ්‍ය වුවද, ප්‍රමාණ පත්‍රිකා වල වීථි ආලෝකකරණ පද්ධතියක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. පසුව, ව්‍යාපෘතිය මඟින් අවශ්‍යතාවය හඳුනාගෙන ඉදිකිරීම් නිම කිරීමෙන් අනතුරුව මේ සඳහා කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර රු.1,174,864 ක මුදලක් අත්තිකාරමක් ලෙස ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් ගෙවා තිබුණි. ආරම්භක අවස්ථාවේදී ව්‍යාපෘතිය මඟින් මෙම අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණේ නම්, උපයෝජනය නොකර ආධාර ලබාදුන් නියෝජිතායතනය වෙත ආපසු යවන ලද රු.324,722,028 ක මුදල මෙම කාර්ය සඳහා භාවිතා කළ හැකිව තිබුණි.

(ආ) වෙනම ශක්‍යතා අධ්‍යයනයක් සිදුනොකර කල්අඩි පාලම ඉදිකිරීමේ දී යොදාගත් ඉහළ ගංවතුර මට්ටම පදනම ලෙස ගෙන මන්මුණේ පාලම ඉදිකිරීමේදී එහි ඉහළම ගංවතුර මට්ටම මීටර් 1.42ක් ලෙස සලකා කටයුතු කර තිබුණි. පසුව, 2012 වර්ෂයේ දී මන්මුණේ ප්‍රදේශයේ ඇතිවූ ගංවතුරෙන් , මීටර් 1.60ක අධික ගංවතුර තත්ත්වයක් වාර්තා වූ බව අනාවරණය විය. මේ අනුව, ගංවතුර කාලයන්වලදී අනාගතයේදී පාලම සම්පූර්ණයෙන්ම ජලයෙන් යටවීමට ඇති හැකියාව විගණනයේ දී බැහැර කළ නොහැක. කලාතුරකින් ඇතිවන අධික ගංවතුර මට්ටමක් සලකා පාලම ඉදිකිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවන බව මේ සම්බන්ධව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා දන්වා තිබුණි.